297

RARE

# ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන්හි කළමනාකරණ අධ්‍යයන අංශවල පාඨකයන්ගේ තොරතුරු අවශ්‍යතා සහ තොරතුරු ගවේෂණ චර්යා

කේ. ආනන්ද

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

| ප්‍රවේශ අංකය | 297 |
| --- | --- |
| වර්ග අංකය | |

2003 දෙසැම්බර්

## සාරාංශය

කළමනාකරණ ක්ෂේත්‍රයට සම්බන්ධ පාඨකයන්ගේ තොරතුරු අවශ්‍යතා, තොරතුරු ගවේෂණ චර්යා, පර්යේෂණ කටයුතු, අධ්‍යයන අවශ්‍යතා පිළිබඳ හැදෑරීම කාලීන අවශ්‍යතාවකි. පුස්තකාලයාධිපතිවරුන්ට සම්පත් තේරීම, ප්‍රතිග්‍රහණය, සංවිධානය හා බෙදා හැරීම යන කටයුතුවල දී ද පුස්තකාලයකට ඉදිරි ප්‍රතිපත්ති සැකසීම, ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම හා සේවා සැපයීම යන කරුණුවල දී ද මෙවැනි පර්යේෂණ වැදගත් වනු ඇත. නවීන තාක්ෂණය පැමිණීමත් සමග පාඨක අවශ්‍යතා සහ ගවේෂණ චර්යා පිළිබඳ දැනුවත් වීම කාලෝචිත ය. මේ පර්යේෂණයේ අරමුණ වුයේ කළමනාකරණ අධ්‍යයන අංශවල පාඨකයන්ගේ තොරතුරු අවශ්‍යතා, විෂයානුබද්ධ අවශ්‍යතා, හා පර්යේෂණ අවශ්‍යතා වෙන් වෙන් වශයෙන් විමර්ශනය කිරීම ය. තොරතුරු ගවේෂණ චර්යා යටතේ තොරතුරු ගවේෂණයේ අරමුණු, මූලාශ්‍ර, මාධ්‍ය හා තොරතුරු ගවේෂණය පිළිබඳව පවතින ගැටලු අධ්‍යයනයට භාජන විය. කළමනාකරණ අධ්‍යයන අංශවල පාඨකයනට අවශ්‍ය සේවා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල පුස්තකාල පද්ධතිය තුළ ක්‍රියාත්මක වේ ද යන්න පිළිබඳ ව ද විමසා බලනු ලැබිණ. තව ද පාඨක සේවා පිළිබඳ තෘප්තිය සලකා බලනු ලැබු අතර තොරතුරු අවශ්‍යතා හා තොරතුරු ගවේෂණ චර්යාවන්හි දී පාඨකයන් නවීන තාක්ෂණ ක්‍රමවේදයක් භාවිත කරන්නේ ද යනාදී කරුණු ද මේ අධ්‍යයනයේ දී විමර්ශනයට භාජන විය.

පර්යේෂණයේ සංගහණය වුයේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියේ ආචාර්ය මණ්ඩලය යි. අධ්‍යයනයේ පහසුව සඳහා නියැදියක් තෝරා ගනු ලැබු අතර ප්‍රතිචාර මට්ටම 77.65%ක් විය. පර්යේෂණ ක්‍රමවේදයේ දී ප්‍රශ්නාවලී ක්‍රමය භාවිත කරනු ලැබිණ. දත්ත විශ්ලේෂණයේ දී වගු සහ ප්‍රස්තාර මඟින් දත්ත ඉදිරිපත් කළ අතර කේන්ද්‍රික ප්‍රවණතාවේ මිණුම් ද උපයෝගී කර ගනු ලැබිණ. දත්තවල නිරවද්‍යතාව මැනීම සඳහා කෙන්ඩෝල්ගේ **W** සුසංගතා සංගුණකය හා $\chi 2$ පරීක්ෂාව යොදා ගන්නා ලදි. පර්යේෂණයේ දී ගොඩ නගන ලද උපන්‍යාසය වුයේ "පුස්තකාලවල තොරතුරු තාක්ෂණයේ භාවිතයත් සමග එහි උපයෝගීතාව වැඩි වී ඇත" යන්න යි. $\chi 2$ පරීක්ෂාව මගින් උපකල්පිතය පරීක්ෂාවට භාජන කළ අතර තොරතුරු තාක්ෂණ භාවිතය පුස්තකාල උපයෝගිතාවට බල පා ඇති බව තහවුරු විය. දත්ත විශ්ලේෂණයෙන් තොරතුරු අවශ්‍යතා සහ විෂයානුබද්ධ අවශ්‍යතා ප්‍රධාන වශයෙන් හඳුනා ගනු ලැබිණ.

තොරතුරු ලබා ගැනීමට කැමති මාධ්‍ය මෙන් ම කැමති භාෂා පිළිබඳ ව ද නිගමනවලට එළඹුණි. පුස්තකාලවල පවතින ප්‍රධාන සේවා අංශ පිළිබඳ අවධානය යොමු විය. තොරතුරු ගවේෂණයේ දී උසස් අධ්‍යාපනය, ඉගැන්වීම් කටයුතු, පර්යේෂණ කටයුතු, විෂය දැනුම වර්ධනය යන මේවා පිළිබඳ ව ද අවධානය යොමු කෙරිණ. තොරතුරු සෙවීමේ චර්යාවන්හි දී පාඨකයා විසින් ම තොරතුරු සෙවීමට වැඩි කැමැත්තක් දැක් වු අතර පරිගණකය වඩාත් ම කැමති මෙවලම විය. පරිගණකය හා බැඳුණු සේවා පිළිබඳ ව පාඨකයා තෘප්තිමත් ව නැත. නවීන තාක්ෂණ ක්‍රමවේද භාවිතයේ දී අන්තර්ජාලය හා ෆැක්ස් භාවිතය ඉහළ මට්ටමක පවතින අතර අනෙකුත් ක්‍රමවේද එතරම් ඉහළ තත්වයක නැත. පුස්තකාලවල පවතින සේවා පිළිබඳ අවබෝධය මඳ බව ද පැහැදිලි විය. මේ ගවේෂණයේ දී මෙවැනි කරුණු අනාවරණය වු අතර අවසානයේ දී නිගමන සහ යෝජනා ද ඉදිරිපත් කර ඇත.